ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
கடற்றொழில் நீரியல் வளத்துறை திணைக்களம்
DEPARTMENT OF FISHERIES & AQUATIC RESOURCES

web site : http://www.fisheriesdept.gov.lk E - mail : info@fisheriesdept.gov.lk

புதிய செயலகம், மாளிகாவத்தை கொழும்பு 10, இலங்கை නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10, ශ්‍රී ලංකාව New Secretariat,Maligawaththa, Colombo 10

මගේ අංකය / எனது இல / My Ref: ධීජසදෙ/ආ02/ 14/අ.ක.ඒ/ 2025/2

ඔබේ අංකය / உமது இல / Your Ref:

දිනය / திகதி / Date: 2025.06.20

සියළුම අංශ ප්‍රධානීන්

ජනාධිපති ලේකම්ගේ අංක PS/SB/Circular/2/2025 සහ 2025.02.28 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන යටතේ මෙම අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

<u>රාජ්‍ය ආයතන තුළ අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීම</u>

**1. අභ්‍යන්තර කටයුතු ඒකක පිහිටුවීම**

රාජ්‍ය නිලධාරින්ගේ සුපිළිපන්නභාවය තහවුරු කරමින් අල්ලසෙන් හා දූෂණයෙන් තොර රාජ්‍ය සේවයක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කිරීමේ වැදගත්කම කෙරෙහි රජයේ ප්‍රමුඛතම අවධානය යොමුව ඇත. රාජ්‍ය අංශය තුළ ශක්තිමත් දූෂණ විරෝධී ක්‍රියාමාර්ග හඳුන්වා දීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වගන්තිය යටතේ දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය (UNCAC) ඇතුළු අනෙකුත් දූෂණ විරෝධී ජාත්‍යන්තර සම්මුතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට ඇති බැඳීම් වලට අනුකූල වන අතරම 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත, අල්ලස් හා දූෂණ වැළැක්වීමේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2025-2029) සහ රජයේ අනෙකුත් ප්‍රතිපත්ති අරමුණු සමඟ අනුගත වේ. අනුව, ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය තුළ දූෂණය මැඩලීමේ ක්‍රියාවලියේ ප්‍රධාන මුලපිරීමක් ලෙස රාජ්‍ය අංශය පුරා විනිවිද භවය, වගවීම සහ සුපිළිපනභාවය පෝෂණය කරන සංස්කෘතියක් නිර්මාණය කර, රජ සේවාවන් සියලුම පුරවැසියන්ට ඵලදායි ලෙස සැපයීම සඳහා සියලුම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන තුළ අභ්‍යන්තර කටයුතු ඒකක (Internal Affairs Unit -IAU) පිහිටුවීමට තීරණය කර ඇත.

එකී රජයේ අවශ්‍යතාවය අනුව 2025.02.23 දින සිට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කටයුතු ඒකකය පිහිටුවා ඇත.

**2. අභ්‍යන්තර කටයුතු ඒකකයේ ප්‍රධාන අරමුණු**

මෙම අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ:

1. ආයතනය තුළ දූෂණ වැළැක්වීම සහ සුපිළිපන්න සංස්කෘතියක් වර්ධනය කිරීම.

ii. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් වල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සහ ආයතනික ක්‍රියාකාරකම් සහ තීරණ සම්බන්ධ තොරතුරු වෙත මහජන ප්‍රවේශය යහතික කිරීම.

iii. ආයතනය තුළ සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කිරීම.

iv. විෂමාචාර වාර්තා කිරීම දිරිගැන්වීම, තොරතුරු හෙළි කරන්නන් ආරක්ෂා කිරීම සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා ආරක්ෂිත සහ ප්‍රවේශය විය හැකි ක්‍රමවේදයක් සකස් කිරීම.

v. නීතිය ක්‍රියාත්මක කරන ආයතන සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් නීති බලාත්මක කිරීමට සහය වීම.

**3. අභ්‍යන්තර කටයුතු ඒකකයේ ව්‍යුහය සහ කාර්ය මණ්ඩලය**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කටයුතු ඒකකය 2025 සහ 2026 වසර සඳහා පහත නිලධාරීන්ගෙන් සමන්විත වේ.

- දර්ශන විජේසිරිවර්ධන මයා - අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - ඒකක ප්‍රධානී
- අයේෂා උදයන්ති පතිරණ මිය - අධ්‍යක්ෂ (පාලන) - සාමාජික
- ඩබ්ලිව්.ටී.එන්.පී.ජයසිංහ මිය - ගණකාධිකාරී (සැපයුම්) - සාමාජික
- එම්.මාකස් මයා - අධ්‍යක්ෂ (සංවර්ධන) - සාමාජික
- ඩී.බී.අබේරත්න මයා - අධ්‍යක්ෂ (කළමනාකරණ) - සාමාජික
- එච්.පී.සසිකා බුද්ධිනි මිය - සහකාර අධ්‍යක්ෂ (පාලන) - සුපිළිපන්න නිලධාරී
- ආර්.ඒ.එච්.පී.එන්.රණමුඛ මයා-කළමනාකරණ සේවා නිලධාරී- සාමාජික
- ඩබ්ලිව්.එස්.මධුහංසි මිය - සංවර්ධන නිලධාරී - සාමාජික
- ඩබ්ලිව්.ඒ.ආර්.එන්.පෙරේරා මයා - නීති සහකාර - සාමාජික

**4. අභ්‍යන්තර කටයුතු ඒකකයෙහි වගකීම් සහ කාර්යයන්**

i. ආයතනය තුළ පවතින පද්ධතිමය බාධාවන් (systemic bottlenecks) හඳුනා ගැනීම සඳහා වත්මන් ක්‍රියාපටිපාටි සහ චක්‍රලේඛ පරීක්ෂා කිරීම සහ මෙහෙයුම කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ඒවා සරල කිරීම.

ii. දූෂණ අවදානම් ඇගයීම (Corruption Risk Assessment) සිදු කිරීම මඟින් ආයතනය තුළ දූෂණයට හා සදාචාර විරෝධී හැසිරීම් වලට ගොදුරු විය හැකි ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ඉලක්කගත වැළැක්වීමේ පියවර ගැනීම්.

iii. ආයතනයේ අවශ්‍යතාවලට ගැළපෙන පරිදි සකස් කරන ලද නිශ්චිත දූෂණ විරෝධී අරමුණු සහ උපාය මාර්ග ඇතුළත් ආයතනික සුපිළිපන්න ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.

iv. ජාතික දූෂණ විරෝධී ක්‍රියාකාරී සැලැස්ම සමඟ ආයතනික ප්‍රතිපත්ති සහ භාවිතයන් පෙළ ගස්වමින් ජාතික දූෂණ විරෝධී උපාය මාර්ගවලට අනුකූල වීම.

v. 2023 අක 9 දරන දූෂණ විරෝධී පනත ඇතුළු ජාතික හා ජාත්‍යන්තර දූෂණ විරෝධී නීති සහ ආයතනයේ අනුකූලතාව ඇගයීම සඳහා අනුකූලතා සමාලෝචන (Compliance Assessments) සිදු කිරීම සහ වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම.

vi. සියලුම රාජ්‍ය නිලධාරීන් සහ සේවා නියුක්තිකයින් සඳහා වත්කම් ප්‍රකාශන අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කිරීම සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා නියෝග සහ 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතට අනුකූලව බැඳියාවන් අතර ගැටුම් කළමනාකරණය කිරීම.

vii. ආයතනය තුළ දූෂණ සහ සදාචාර විරෝධී හැසිරීම් සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම, එවැනි සියලුම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ නිලධාරීන් හෝ ඒකක විසින් කඩිනමින් කටයුතු කරන බවට සහතික වීම සහ විනිවිදභාවය සහ වගවීම සහතික කරමින් විමසීම් සිදු කරන අදාළ පාර්ශවකරුවන් වෙත නිරන්තර යාවත්කාලීන කිරීම් ලබාදීම. අවශ්‍ය පරිදි, දූෂණ විරෝධී පනත යටතේ විමර්ශනය සඳහා අදාළ කරුණු, සොයා ගැනීම් හෝ තොරතුරු අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීම.

viii. ආයතනය විසින් සපයනු ලබන සේවාවන් විස්තර කෙරෙන පුරවැසි ප්‍රඥප්තියක් සංවර්ධනය කර ප්‍රකාශයට පත් කිරීම.

ix. රාජ්‍ය නිලධාරීන් විසින් පිළිපැදිය යුතු ප්‍රමිතිගත ආචාරධර්ම සංග්‍රහයක් ඇතුළුව, සදාචාරාත්මක පාලනය ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම සහ බලාත්මක කිරීම.

x. දූෂණ විරෝධී මූලධර්ම වලට කැපවී සිටීමට අභිප්‍රේරණයක් ලෙස කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුවත් කිරීම ඇතුළු අනෙකුත් ක්‍රියාමාර්ග ගැනීම.

xi. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ ජාතික දූෂණ විරෝධී රාමුව මඟින් මෙහෙයවනු ලබන සුපිළිපන්න ඇගයීම් ක්‍රියාවලින් සඳහා ආයතනය සහභාගී වන බව සහ ඒ සමඟ පෙළගැසෙන බව සහතික කරමින්, ජාතික දූෂණ විරෝධී සුපිළිපන්න ඇගයීම (National Anti-Corruption Integrity Assessment) සඳහා ආයතනික කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කිරීම.

xii. ඒකකයේ රාජකාරි ක්‍රියාත්මක කිරීමේදී අඛණ්ඩ මගපෙන්වීම් සහ සහාය ලබා ගැනීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ සම්බන්ධතා පවත්වා ගැනීම.

xiii. අභ්‍යන්තර කටයුතු ඒකකයෙහි ක්‍රියාකාරකම්, දූෂණ විරෝධී මුලපිරීම්වල ප්‍රගතිය, මුහුණ දෙන අභියෝග සහ ඉදිරි ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ සාරාංශගත කරමින් කාලානුරූපී සහ වාර්ෂික වාර්තා සකස් කිරීම.

xiv. පුද්ගලික අංශයේ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයෙන් සුපිළිපන්නතාවය වර්ධනය කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**5. අභ්‍යන්තර කටයුතු ඒකකය මඟින් ඉටුකිරීමට අපේක්ෂිත කටයුතු**

2025 සහ 2026 වසර සඳහා පත් කරන ලද ඉහත කමිටු සාමාජිකයන්ගෙන් සමන්විත අභ්‍යන්තර කටයුතු ඒකකය මඟින් පහත ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂා කෙරේ.

i. අභ්‍යන්තර කටයුතුවල කාර්යභාරය පිළිබඳ දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් දැනුවත් කිරීම.
ii. සුපිළිපන්න ආයතනික සංස්කෘතියක් ඇති කිරීම සඳහා සුපිළිපන්නභාවය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
iii. දෙපාර්තමේන්තුව සහ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරිපත්වන පැමිණිලි සම්බන්ධයෙන් සුදුසු පරිදි පරිපාලනමය ගැටළු විසඳීමට යොමු කිරීම හෝ අවශ්‍ය පරිදි ඉදිරි කටයුතු කිරීම.
iv. චක්‍රලේඛ හා බැරකම් ප්‍රකාශ නියමිත පරිදි අල්ලස් හා දූෂණ විමර්ශන කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම.
v. ආයතනයේ දූෂණ අවධානම් හඳුනා ගැනීමට හා එම අවධානම් මඟ හරවා ගැනීම සඳහා සුපිළිපන්න ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.
vi. ආයතනික සුපිළිපන්නභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පරිදි පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

**6. අභ්‍යන්තර කටයුතු ඒකකය වෙත පැමිණිලි යෝජනා ඉදිරිපත් කිරීම.**

ධීවර හා ජලජ සම්පත්දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කටයුතු ඒකකය ප්‍රධාන කාර්යාලය පිහිටි ගොඩනැගිල්ලේ 5 වන මහලේ පිහිටා ඇත. මෙම ඒකකය වෙත ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන පැමිණිලි/ යෝජනා එම ස්ථානය වෙත ලබාදීමට හැකියාව පවතී.

තව ද එම ඒකකයෙහි පැමිණිලි ලිපි මඟින්, පහත දැක්වෙන විද්‍යුත් ලිපිනය වෙත විද්‍යුත් පණිවිඩ හරහා හෝ පැමිණිලි පෙට්ටිය හරහා ඔබගේ පැමිණිලි ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී.

විද්‍යුත් ලිපිනය - internalaffairs@fisheriesdept.gov.lk

ඒකකය වෙත පැමිණිලි ඉදිරිපත් කළ හැකි දුරකථන/ වට්ස්ඇප් අංකය ඉදිරියේදී දැනුම්දීමට කටයුතු කරනු ලැබේ.

මෙම ඒකකය හා එහි කාර්යභාරය පිළිබඳ ඔබ අංශයේ සියලුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන්න.

සුසන්ත කහවත්ත
ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්

සුසන්ත කහවත්ත
අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව